රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 04/2020

මගේ අංකය : EST-1/CIRL/03/0001
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2020.02.18

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>ස්පීඩ් පෝස්ට් හා ලොජි පෝස්ට් කුරියර් සේවාවන් භාවිත කිරීම</u>**

රාජ්‍ය සේවය තුළ රාජකාරි ලිපි හා භාණ්ඩ හුවමාරු කිරීමේදී ඉහළ ආරක්ෂාවක් හා වැඩි සැලකිල්ලක් අවශ්‍ය වන ඕනෑම අවස්ථාවකදී රාජ්‍ය ආයතනවලට ලියාපදිංචි තැපැල මෙන්ම ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුව මඟින් හඳුන්වා දී ඇති ස්පීඩ් පෝස්ට් හා ලොජි පෝස්ට් කුරියර් සේවාව ද භාවිත කළ හැකි ය.

02. ස්පීඩ් පෝස්ට් සහ ලොජි පෝස්ට් කුරියර් සේවාව සඳහා නිකුත් කරනු ලබන කුවිතාන්සිය සඳහා ද ලියාපදිංචි තැපැල භාවිත කිරීමේ දී හිමි වන නෛතික වලංගුභාවය ඒ ආකාරයෙන්ම හිමි වේ.

03. මෙම චක්‍රලේඛය තොරතුරු සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ එකඟත්වය ඇතිව නිකුත් කෙරේ.

එස්. හෙට්ටිආරච්චි
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය